# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII YEAR OF OUR LORD JESUS CHRIST, 2024 AUGUST Issue No. 09


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 85:1-9)**

01. ස්වාමිනි, ඔබගේ දේශයට ඔබ කරුණාකළසේක. යාකොබ් වහල්කමින් මුදා ගෙනාසේක.

02. ඔබගේ සෙනඟගේ අයුතුකම කමා කළසේක, ඔවුන්ගේ පව් සියල්ල වැසූසේක.

03. ඔබගේ මුළු උදහස පහකරදැමූසේක. ස්වකීය තද කෝපයෙන් හැරුණුසේක.

04. අපේ ගැළවීමේ දෙවියන්වහන්ස, අප හැරෙවුව මැනව, අප කෙරෙහි වූ ඔබගේ කෝපය නැවැත්වුව මැනව.

05. ඔබ අප සමඟ සදාකල්ම උදහස් වනසේක්ද? සියලු පරම්පරාවලට ඔබගේ උදහස පවත්වනසේක්ද?

06. ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිමත් වන පිණිස අප නැවත ජීවත් නොකරනසේක්ද?

07. ස්වාමිනි, ඔබගේ කරුණාව අපට දැක්වුව මැනව, ඔබගේ ගැළවීම අපට දුන මැනව.

08. දෙවිවූ ස්වාමීන්වහන්සේ කුමක් කියනසේක්දැයි අසන්නෙමි. මක්නිසාද උන්වහන්සේ ස්වකීය සෙනඟටත් ශුද්ධවන්තයන්ටත් සමාදානය වදාරනසේක. නුමුත් ඔව්හු අඥානකමට නැවත නොහැරෙත්වා.

09. තේජස අපේ දේශයේ වසන පිණිස සැබවින්ම උන්වහන්සේගේ ගැළවීම උන්වහන්සේට භයවෙන්නන් සමීපයෙහිය.

# ඉදිරියට ගෙනයන්නාවූ ස්වාමින්වහන්සේ ! බාල් පෙරාශිම් !

## THE LORD OF BREAKTHROUGHS! BAAL PARAZIM! (2 samuel 5:20)

*(ප්‍රධාන කර්තෘ දේවගැති ඇන්ජලින් සෙල්ව කුමාරි)*



කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ සියලුම සාමාජිකයන්ට සුභ පතමි. මෙම සඟරාව තුලින් ඔබ හා සමග සම්බන්ද වීමට ලැබීම මට මහත් වූ ආශිර්වාදයකි. අපගේ ජීවිතයේ අප නව කාල පර්ච්ඡේදයකට ඇතුල්වෙමු. සෑම කාල පරිච්ඡේදයක්ම ඉතා අලංකාරය. ග්‍රීස්මකාලය හා වර්ෂාව යන දෙකම අපගේ වර්ධනයට ඉතාම අවශ්‍යම තිබේ. දේව වචනය මෙසේ පවසයි. ***"උන්වහන්සේ සියලු දේම ඒ ඒ කාලයට සුදුසු ලෙස සලස්වා තිබේ..." (දේශනාකාරයා 3:11)*** සාලමොන් රජතුමා පවසන්නාවූ ආකාරයට ඉර යට සිදුවෙන සෑම දේටම සෘතුවක් ඇත. මේ වර්ෂයෙ තුළදී ඔබගේ ජීවිතය තුල ඔබ කුමන කාල පර්ච්ඡේදයක් තුලින් ගමන් කරනු ලැබුවත් ඔබ කුමන අත්දැකීම වලට මුහුණ දෙනු ලැබුවත් තව යහපත් වූ දේ පැමිණෙන්නට තිබෙන බව මතකයේ තබා ගන්න. අප දෙවියන්වහන්සේගේ පොරොන්දු වලට ඇලුම් වී උන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ඨ කරනවාය කියා අප සිතුවත් අපට බොහෝ සටන්වලට මුහුණ දීමට සිදුවෙනු ඇත.

දෙවියන්වහන්සේගේ පොරොන්දු අපගේ ජීවිත වල ඉෂ්ඨ වී එය ප්‍රකාශ වීමට සති ගණන් මාස ගණන් වසර ගණන් හෝ දශකයක් යාමට පුළුවනි. දාවිත්ගේ ජීවිතය තුළ ද දෙවියන්වහන්සේගේ අනාවැකිය ඉෂ්ඨ වන පිනිස වසර 15 වසර 20 ක් දක්වා කාල පරිච්ඡේදයක් බලා සිටින්නට සිදුවිය.

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

An opportunity to pray with **Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## from your dearly beloved brother...



REACHING NATIONS



**"මාගේ යාච්ඤාවද මා කෙරෙන් තමන් කරුණාවද පහ නොකළා වූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා" (ගීතාවලිය 66:20)**

ප්‍රිය සහෝදරයා, සහෝදරිය,

කැඳවීමේ ප්‍රතිරාවය මූලස්ථානයේ සිට ස්වාමී වූ යේසුස්වහන්සේගේ නාමයෙන් අපි ඔබ සියලු දෙනාටම සුබ පතමි.

ඔබ අපට කෙතරම් සුවිශේෂද කියා ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. පසුගිය වසර ගණනාවක් පුරා ඔබ, ඔබගේ දෙමාපියන් සහ ආච්චිලා, සීයලා සමඟ එක්ව මෙම ආත්මික ගමන යමට 1969 වසර ආරම්භයේ සිටම කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළ අද දක්වාම සිටින නිසා අපි ඔබට ස්තූති කරමු. සැම විටම දෙවියන්වහන්සේගේ කරුණාව ඔබ හා සමඟ තිබෙන නිසා ස්තූතියි.

කැඳවීමේ ප්‍රතිරාවය සේවය අගෝස්තු මස 10 න දිනට වසර 56 ක් සම්පූර්ණ වෙයි. අප ඔබ හා සමඟ අත්වැල් බැඳගෙන මෙම ජයග්‍රාහී මොහොත යේසුස්වහන්සේගේ නාමයෙන් සැමරීමට සූදානම් වෙමු. මේ කාල වකවානුව තුළදී ඔබ අපට කළ සැම දේ නිසාම ස්තූති කරමු. ඔබගේ යාච්ඤාව හා මුදල්මය උපකාර සියල්ලම අපි ඉතාම අගය කරමු. මගේ අවංක යාච්ඤාව නම්, දෙවියන්වහන්සේ ස්වර්ගයේ කවුළු අරිමින් උන්වහන්සේගේ අනර්ඝ ආශිර්වාදය ඔබ කෙරෙහි වගුරුවන පිණිසයි.

අගෝස්තු මස 9-11 වන දිනයන් වලදී අපගේ 56 වන සංවත්සරය සැමරීමට බලාපොරොත්තු වෙමු.

අප කැපවී සිටින්නේ දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කරන පිණිසය. අපට තිබෙන්නා වූ සම්පත් තුළින් හා දෙවියන්වහන්සේ කරුණාව තුළින් මෙම සැමරීම ඉතා අලංකාරව පැවැත්වීමට බලාපොරොත්තු වෙමු.

මෑතකදී අප අපගේ සේවා ස්ථාන වලට ගිය අවස්ථාවේදී උතුරු ඉන්දියාවේ ගුජරාත් ප්‍රදේශයේ ඉතාම දුෂ්කර ගම්මාන දෙකක් වූ දුම්ඩා සහ අකිර්පාඩා යන ස්ථාන වලට යාමට අපට අවස්ථාව ලැබුණි. එසේම ජුනි මස 28-30 වන දිනයන්හිදී අප තවත් බොහෝ ස්ථාන වලට යෑමට බලාපොරොත්තු වෙමු. මේ උදෙසා ඔබගේ යාච්ඤාව අපට අවශ්‍යව ඇත.

දෙවියන්වහන්සේගේ කරුණාව කරුණකොටගෙන අප යන්නා වූ සැම ස්ථාන වලට උන්වහන්සේගේ සුභාරංචිය ප්‍රකාශ කරමින් සභාවන් පිහිටුවීමට උන්වහන්සේ අපට උපකාර කළේය. සියලු ගෞරවය හා මහිමය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පුද කරමි.

අපගේ පවුල් වලත්, සේවාවන් වලත් තිබෙන්නා වූ විවිධාකාර සෝදිසි හා පරීක්ෂා වලදීත් අපට ඔබ දැක් වූ සහයෝගය නිසා අපි ඔබට අනේකවාරයක් ස්තූති කරමු. අපද ඔබ සමඟ අත්වැල් බැඳගෙන ඉදිරියට යාමට බලාපොරොත්තු වෙමු. ඔබගේ යාච්ඤා වලදී අප ගැනද යාච්ඤා කරන්න. අපද ඔබ උදෙසා යාච්ඤා කරමු.

දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා ආශිර්වාදය ඔබ සමඟ වේවා.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

සාමුවෙල් ඔහුව ඉශ්‍රායෙල්හි රජ ලෙස ආලේප කල මුත් දෙවියන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ඨ කිරීමට උන්වහන්සේ හදිසි වෙන්නේ නැත. උන්වහන්සේ ක්‍රියාත්මක වෙනු ලබන්නේ උන්වහන්සේගේ වේලාව අනුවය. ස්වාමින්වහන්සේ නියමිත කාලයේදී උන්වහන්සේගේ සැලැස්ම ඉෂ්ඨ කරන තුරු අප ඉතා ඉවසීමෙන් යුතුව බලා සිටිය යුතුව බලා සිටිය යුතුය. දාවිත් මෙය තේරුම් ගත්තේය. ගීතාවලිය පොතෙහි බොහෝ ස්ථාන වල ''ස්වාමින්වහන්සේ කෙරෙහි ඉවසීමෙන් බලා සිටින්න.'' කියා ඔහු පවසන්නේ මේ නිසාය.. අපගේ යාච්ඤාවන් වලට පිලිතුරු දෙන්නාවූ දෙවියන්වහන්සේ අපගේ කඳුළු රැස්කර තබාගන්නවාය කියා දේව වචනය පවසා ඇත. උන්වහන්සේ එඬේරෙක් ලෙස අපට රැකවරණය හා මඟ පෙන්වීම ලබා දෙනු ඇත. එසේම මිත්‍රයෙක් ලෙසත් මවෙක් ලෙසත් පියෙක් ලෙසත් සහකරුවා ලෙසත් හා පර්වතයක් ලෙසත් ස්වාමින්වහන්සේ ඔබව රැකබලා ගන්නවා ඇත. උන්වහන්සේගේ නාමය අනර්ඝයි. උන්වහන්සේ බොහෝ නාමයන් වලින් හඳුන්වයි. මේ එක් එක් නාමයන්ගෙන් හඳුන්වනු ලැබුවත් තම තමා උන්වහන්සේව හඳුනන අත්දැකීමක් තිබෙනු ඇත. මගේ ජීවිතයේ මට මහත් ආශිර්වාදයක් වූයේ ''බාල් පෙරාශිම්' යන අත්දැකීමයි. *(2 සාමුවෙල් 5:20)* මෙහි තේරුම නම්, ''දෙවියන්වහන්සේ සෑමදේම කඩාගෙන ඉදිරියට යයි.'' යන අරුතයි. මෙය, ජල පහරක් ඉදිරියට ගලාගෙන යන විටදී එයට බාධා වෙන්නාවූ සියලුම දේ කඩාගෙන ඉදිරියට යාමක් ලෙස අර්ථ ගැන්විය හැක. දෙවියන්වහන්සේද සෑම බාධාවක්ම කඩාගෙන ඉදිරියට යයි.

කිසියම් පුද්ගලයෙකුට අප නමක් තබන විටදී එසේ නොමැතිනම්, ව්‍යාපාරයකට නිවසකට ආදී දෙයකට නමක් තබන විටදී එයට කිසියම් තේරුමක් ඇතිව නම් තබයි. එබැවින් අප යම් යම් දේවලට නම් තබන විටදී දෙවියන්වහන්සේගේ ප්‍රඥාව ලබා ගනිමින් එම නම් වලට නිවැරදි අර්ථයක් ඇතිව තබනවා නම් එහි ආශිර්වාදය අපට ලැබේ.

## රෙෆාවරින්ගේ මිටියාවත

බාල්-පෙරාහිම් යන නමෙහි පසුබිම මා ඔබට මෙහිදී සඳහන් කරමි.

2 සාමුවෙල් 5 වෙනි පරිච්ඡේදයෙහි දාවිත්ව ඉශ්‍රායෙල් සෙනඟට රජ කෙනෙක් ලෙස ආලේප කරනු ලැබුවේය කියා සඳහන් කරයි. එය ඔහුගේ ජීවිතයෙහි ඉතාම අනර්ඝවූ කාල පරිච්ඡේදයකි. මෙම ආලේපයෙන් පසුව දෙවියන්වහන්සේගේ යහපත්කම හා ආශිර්වාදය ගලා යා යුතුව තිබූ නමුත් දාවිත් මහත් අභියෝගයන් වලට මුහුණ දෙනු ලැබුවේය. *(හිතෝපදේශ 13:12)* යක්ෂයා ගැන දේව වචනය සඳහන් කරනු ලබන්නේ, ඔහු බොරුකාරයෙක් හා ගොරවන සිංහයෙකු ලෙස සිටින බවයි. එනම්, දාවිත්ගේ සාමාදානයත් ප්‍රීතියත් ඔහුට ලැබීමට තිබූ ආශිර්වාදත් නතර කිරීමට බොහෝ අභියෝගයන් ඇති විය.

දාවිත්ගේ ආලේපය ගැන ඇසූ පිලිස්තිවරු ඔහුට විරුද්ධව සටන් කරන පිණිස රෙෆාහිම් මිටියාවතෙහි රැස්විය.

## (1) දෙවියන්වහන්සේගේ සැලසුම කෙරෙහි යක්ෂයාගේ අවධානය යොමු විය.

දෙවියන්වහන්සේගේ සැලසුම තුල ගමන්කරන විටදී සතුරාගේ බලවේගය අපට බොහෝ ආකාර විරුද්ධතාවයන් ගෙනදෙනු ඇත. ඔහුට පැමිණෙන්නාවූ තර්ජන ගැන දාවිත් දැන සිටියේය. එම නිසා ඔහු සටනට යාමට පෙර දිව්‍යමය මග පෙන්වීම සෙව්වේය.

අපට පැමිණෙන්නාවූ බාධාවන් මළපත් යන සෑම දේ තුලදී අප මතක තබා ගත යුත්තේ රෙෆාහිම් මිටියාවතදී සතුරාගේ බලය කඩා දැමූවාක් මෙන් දෙවියන්වහන්සේ අපගේ සෑම ප්‍රශ්නයකටම මැදිහත්වන වන බව අපි විශ්වාස කරමු. දෙවියන්වහන්සේ අපගේ ජීවිතයට පැමිණෙන්නාවූ සියලුම බාධාවන් ගලාගෙන යන්නාවූ ජලය සියලුම බාදාවන් කඩාගෙන ඉදිරියට යන්නාක් මෙන් ස්වාමින්වහන්සේගේ ජයග්‍රහණය අපට ලබාදෙයි. ''බාල්-පෙරාශිම්' වල ස්වාමින්වහන්සේ කල ක්‍රියාව ඔබගේ ජීවිතයෙහිද කිරීමට උන්වහන්සේ බලවත්ය.

ප්‍රිය මිත්‍රවරුනි ඔබ කොතැනක සිටියත් ඔබගේ ජීවිතයෙහි ඔබ කුමනාකාර අවස්ථාවන වලට මුහුණ දෙනු ලැබුවත් ශක්තිමත් වෙන්න, නිර්භීතවෙන්න හා ප්‍රීතියෙන යුතුව ඉදිරියට යන්නය කියා මා ඔබව ධෛර්‍යයමත් කිරීමට කැමැත්තෙමි. මන්ද අප සේවය කරනු ලබන්නේ, සියලුම බාධාවන් කඩාගෙන ඉදිරියට ගෙනයන්නාවූ දෙවියන් වහන්සේටයි. අපව ඉදිරියටම ගෙනගොස් අපගේ සතුරන්ව පරාජයට පත්කරන බවට උන්වහන්සේ අපට පොරොන්දු වෙයි. දෙවියන්වහන්සේ පිලිස්තිවරුන්ට විරුද්ධව සිට දාවිත්ට දුන්නාවූ ජයග්‍රහණය ඉතාම අනර්ඝය. එනම්, ජල බිඳීමක් මෙන් අපගේ සියලුම බාධාවන් බිඳගෙන දෙවියන්වහන්සේ අපව ඉදිරියට ගෙන යයි. මෙම ජයග්‍රහණය ලබා ගන්නාවූ ස්ථානයට ''බාධා කඩා ඉදිරියට යන'' ස්ථානය කියා දාවිත් නම් තබනු ලැබුයේ මේ නිසාය.

මිත්‍රවරුනි, ඔබගේ ජීවිතයේ තිබෙන්නාවූ සියලුම බාධාවන් කඩාගෙන ඉදිරියට යන්නාවූ කාලය මෙය බව මතක තබාගන්න. යාච්ඤා කරන්න. ජයග්‍රණය අත්පත් කර ගන්න. එම ජයග්‍රහණය ප්‍රකාශ කරන්න. ඔබගේ විශ්වාසය ප්‍රකාශ කරන්න. මෙය මාගේ ඉදිරියට යාමේ කාලයයි. 'බාල් පෙරාශිම්' මට මග පෙන්වයි. මට විරුද්ධව පැමිණුනාවූ ආයුධ බල රහිත කරයි. මගේ පවුල, මගේ විවාහය, මගේ ව්‍යාපාරය, මගේ දරුවන්, මගේ සේවය යන සියල්ලම විරුද්ධව එන සියල්ලට ස්වාමින්වහන්සේ මගේ 'බාල් පෙරාශිම්' කියා ශබ්ද නඟා පවසන්න. නොසැලෙන ඇදහිල්ලෙන ප්‍රකාශ කරන්න. ඔබ දැන් ගමන් කරන්නාවූ ප්‍රශ්නකාරී වාතාවරණය දෙස නොබලන්න. ස්වාමින්වහන්සේගේ සැලසුම විශ්වාස කරන්න. යෙරිකෝ පවුර වටා ඉශ්‍රායෙල් සෙනඟ ගමන්කර 7 වන දිනදී ජයගත්තාක් මෙන් අපගේ බලයෙන් අපට කිසිවක් කිරීමට නොහැකිය. නමුත් දෙවියන්වහන්සේට සියල්ල පුළුවන කියා විශ්වාස කරන්න. මොසෙස්ගේ අතේ තිබුණේ සැරයටියකි. ඉශ්‍රායෙල් සෙනඟට හාස්කමක් කිරීමට එය පාවිච්චි කළේය. එබැවින් අප දැකිය යුත්තේ අපගේ මාංශික ඇස්වලින් නොව ආත්මික ඇස් වලින් පමණි. 'බාල් පෙරාශිම්' දෙවියන්වහන්සේ ඔබගේ හතුරන් විනාශ කරන පිණිස ඔබගේ ඉදිරියෙන් යනවාය කියා විශ්වාස කරන්න.

## (2) සැඟවී සිටින විට දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට යන්න.

පාපයක් වූ අවස්ථාවකදී හො වෙනත් ප්‍රශ්ණකාරී අවස්ථාවකදීත් අප තනිවී සැඟවී සිටින්නාවූ අවස්ථාවේදීත් අපගේ ජීවිතය කඩාගෙන ඉදිරියට යාමට දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය වෙතට යා යුතුය. දාවිත් තමා වටා සතුරන් පිරී සිටින බව තේරුම්ගත්තේය. ඔහු දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට යනු ලැබුයේ උන්වහන්සේගේ මග පෙන්වීම ලබා ගන්නා පිණිසය. අපගේ ප්‍රශ්න අප දෙවියන්වහන්සේ වෙතට ගෙන යනවාද ? අප ප්‍රශ්නකාරී තත්ත්වයන්ට වලට මුහුණ දෙන විටදී අපගේ ප්‍රතිචාරය කුමක් ද? ඔබගේම සැලසුම් ක්‍රියාත්මක නොකර නිතරම ඉතා යටහත් පහත් ලෙස දේව අභිමුඛත්වය වෙතට ගොස් උන්වහන්සේගෙන් අසමින් උන්වහන්සේව සොයමින් හා උන්වහන්සේගේ දොරට තට්ටු කරමින් උන්වහන්සේ දෙන පිළතුර ගැන බලා සිටින්න.

දාවිත්ව සතුරන් වටකර සිටින විට ඉතා යටහත් පහත්ව දණගසා දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ගොස් උන්වහන්සේගේ උපදෙස් සෙව්වේය. 2 සාමුවෙල් 5:19 හි දෙවියන්වහන්සේ දාවිත්ට ප්‍රතිචාර දක්වමින් සතුරාට විරුද්ධව යන්න කියා පැවසීය. අප නමස්කාර කරන්නාවූ දෙවියන්වහන්සේ අපගේ කන්නලව් අසා අපට පිළිතුරු දෙන්නාවූ ස්වාමින්වහන්සේයි. ඔබගේ ජීවිතයෙහි තිබෙන්නාවූ සියලුම බාධාවන් සහ සතුරාගෙන් ඇතිවන සියලු අභියෝග පරාජයට පත් කරමින්, සියල්ල කඩාදමා ඉදිරියට යාමට අවශ්‍ය නම්, ස්වාමින්වහන්සේ වෙතට යන්න උන්වහන්සේගේ ප්‍රතිචාරය ඉතාම පැහැදිලියි. ස්වාමින්වහන්සේ ඔබට ජය අත්පත් කරදෙන සේක.

## (3) රෙපායිම් මිටියාවතේ සිට බාල් - පෙරාශිම් වෙතට පරිවර්තනීය මාරුව

පිලිස්තිවරු 'රෙපායිම් මිටියාවතෙහි' රැස්වී දාවිත්ව විනාශ කිරීමට සැලසුම් කළෝය. මෙම 'රෙපායිම් මිටියාවත' යම් පුද්ගලයෙකුගේ ජීවිතයෙහි දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉෂ්ට කිරීමටත්, නතර කිරීමටත් හා බාධා කිරීමටත් යක්ෂයා ක්‍රියා කරන්නාවූ ස්ථානයකට සමාන කල හැකිය. බොහෝ අය මෙවැනි තත්ත්වයන් තුල සිටී. එනම්, ඔවුන්ගේ පරාජිත තත්ත්වයන් අසාර්ථකවීම්, ඔවුන්ගේ සැමදේම නැතිවීම හා බිය ඇතිවීම ආදිය ගොරවන සිංහයෙක් මෙන් ඔවුන්ට විරුද්ධව පැමිණෙනවා දැකීමයි. මෙවැනි සිදුවීම් ඔබගේ ජීවිතයට පැමිණෙන්නේ, ඔබගේ ජීවිතයට ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම විනාශ කිරීමටයි එහිදී දෙවියන්වහන්සේ ඔබට බලවත් වූ ජයග්‍රහණයක් දී ඒ සියල්ලම වෙනස් කරනු ලබයි.

## බාල් පෙරාශිම්

පිලිස්තිවරුන්ගේ දෙවි වූ බාල්වත් පිලිස්ති සේනාවක් දෙවියන්වහන්සේ විසින් විනාශ කල පසු දාවිත් එම ස්ථානයට 'බාල්-පෙරාශිම්' යන නම තබන ලදී. එනම්, සතුරාගේ සියලු බලතල කඩා දමමින් දෙවියන්වහන්සේගේ බලය ස්ථාපිත කරනු ලැබුවේය. අද දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, ඔබගේ ජීවිතයෙහි ඔබ මුහුණ දෙනු ලබන සතුරාවත්, ඔහුගේ සැලසුමත් හා සියලු බාධාවනුත් කඩා බිඳ දමා දාවිත්ව ඉදිරියට ගෙන ගියාක් මෙන් ඔබවත් උන්වහන්සේ ඉදිරියට ගෙන යාමයි. දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම අපව ජයග්‍රණය කරා ගෙනයයි.

දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයට අනර්ඝ ජයග්‍රහණයක් ගෙනදෙන පිණිසත් ඔබ දිගු කාලයක් පුරාවට බලා සිටියාවූ විසඳුම ඔබට ගෙන දෙණ පිණිසත් දෙවියන්වහන්සේ ඔබ ගැන බලා සිටී.

ප්‍රිය සහෝදරයා සහෝදරිය මේ දේ ඔබ කියවා

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අගෝ:19-** නෙහෙමියා බයිබල් විදුහලේ කාරක මඩුල්ලත්, ඔවුන්ගේ පවුල්වල සැමදෙනා උදෙසාත් දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**අගෝ:20-** අපගේ යාච්ඤා පංගුකාරයී ඇදහිල්ලේ පංගුකාරයින් සහ උපකාර කරන්නා වූ සැමදෙනාගේම පවුල් උදෙසා යාච්ඤා කරන්න

**අගෝ:21-** කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ සේවයට කැපවීමෙන් උදව් උපකාර කරන්නා වූ කර්තෘවරුන් උදෙසා යාච්ඤා කරන්න.

**අගෝ:22-** අපට දෙවියන්වහන්සේ විසින් දී තිබෙන්නා වූ කැපවී සිටින්නා වූ සේවක මඩුල්ල උදෙසා යාච්ඤා කරන්න.

**අගෝ:23-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ මුද්‍රණාලය පවත්වාගෙන යාමට උපකාර කරන්නා වූ සියලුම අංශවල අය නිසා ස්තුති කරන්න.

**අගෝ:24-** සැම මසකම අපට මුදල්මය අතින් උපකාර කරන්නා වූ අය නිසා ස්තුති කරන්න.

**අගෝ:25-** ශාන්ත පාවුළු මෙට්. පාසලේ විදුහල්පති, ගුරු මණ්ඩලය සහ ශිෂ්‍යයින නිසා ස්තුති කරන්න.

**අගෝ:26-** ශාන්ත පාවුළු මෙට් පාසල, නෙහෙමියා බයිබල් විදුහල හා තැපැල් මාර්ගින පාඨමාලාවටත් දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබී තිබෙන නිසා ස්තුති කරන්න.

**අගෝ:27-** ධර්මදූත සේවය කරන්නා වළ අයගේ කැපවීම නිසා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

**අගෝ:28-** 2024 අගෝස්තු මස 10 වන දින අපගේ 56 වන සංවත්සරය සැමරීමට කලා වූ ආශිර්වාදය නිසා ස්තුති කරන්න.

**අගෝ:29-** ප්‍රධාන පාලකතුමාට හා ඔහුගේ පවුලට දුන් ආරක්ෂාව නිසා ස්තුති කරන්න.

**අගෝ:30-** දේවගැති සැම් සෙල්ව රාජ් ඇතුළු ඔහුගේ කණ්ඩාමට ගුජරාත්, සුරාට් යන ස්ථාන බැහැදැකීමට ආශිර්වාදයක් වූ නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**අගෝ:31-** පසුගිය මාසයේ අපගේ සියලු වියදම් දෙවියන්වහන්සේ සැපයූ නිසා ස්තුති කරන්න.

**සැප්:01-** අපගේ සභාවට අලුතින් පැමිණුනාවූ සියලුදෙනා උදෙසා ස්තුති කරන්න.

**සැප්:02-** ශාන්ත පාවුළු මෙට්. පාසලට අලුතින් පැමිණුනාවූ අය උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:03-** අපගේ සියලු කාර්ය මඩුල්ල හා ඔවුන්ගේ පවුල් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**සැප්:04-** අපගේ ප්‍රධාන පූජක සැම් සෙල්ව රාජ්ට දෙවියන්වහන්සේ අලුත් දර්ශනයකට සේවය ව්‍යාප්ත කරන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:05-** කැඳවීමේ ප්‍රතිරාවය ප්‍රධාන සභාවේ හා ශාඛා සභාවන් වල සිටින ඇදහිලිවන්තයින්ගේ පවුල් හා ඔවුන්ගේ සුභසාධනය උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:06-** සැම කිතුණු සංවිධානයක් හා සභාවන් වල දෙවියන්වහන්සේගේ ආරක්ෂාව දෙන්න කියා යාච්ඤා කරන්න.

**සැප්:07-** අපගේ සේවාවන් ව්‍යාප්ත වීමටත් ලෝකයේ සැම ස්ථාන වලටම සුභාරංචිය ව්‍යාප්ත වන පිණිසත් යාච්ඤා කරන්න.

**සැප්:08-** කිසිම බාධාවකින් තොරව කිතුණු දේශකයින් සුභාරංචිය දේශනා කරන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:09-** සියලු ජාතීන් අතර සමාදානය සහ එක්සත්භාවය තිබෙන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:10-** අපගේ මුද්‍රණාලයේ සිටින සියලුම සේවක මඩුල්ල උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:11-** පාස්ටර් සැම සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු සාමාජිකයින් සියලු නපුරෙන් ආරක්ෂා කරන්න කියා යාච්ඤා කරන්න.

**සැප්:12-** අපගේ සියලු සේවාවන් ක්‍රියාත්මක වන පිණිසත් ඒවා තවත් ව්‍යාප්තවන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:13-** ඉන්දියාවේ සුභාරංචිය නොගිය ස්ථාන වලට සුභාරංචිය යන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:14-** ලෝකයේ සිටින්නා වූ සියලු කාන්තාවන් හා දරුවන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:15-** මත් ද්‍රව්‍යයට ඇබ්බැහි වී සිටින්නා වූ හා නපුරු ක්‍රියා කරන්නා වූ අයගේ ගැළවීම උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:16-** අපගේ නෙහෙමියා බයිබල් විදුහලට තවත් බොහෝ දෙනෙක් ඇතුළත් වන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:17-** අපගේ කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල් වල ශුභසාධනය උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:18-** අපගේ සියලු අවශ්‍යතාවයන් දෙවියන්වහන්සේ සපයන්න කියා යාච්ඤා කරන්න.

....Contd. from page 4

ඇදහිල්ලෙන් ප්‍රකාශ කරන්න. නිර්භීතව පවසන්න. ''අද මගේ ජීවිතයෙහි ජයග්‍රහණයේ පටන්ගැන්මයි. මගේ ජීවිතයේ බාධාවන් කඩාගෙන ඉදිරියේ ජය ගන්නාවූ දවස අදයි'' ඔබ මෙලෙස කථාකර ප්‍රකාශ කරනවා නම්, රෙපායිම් මිටියාවතේ සිට බාල් පෙරාශිම් වෙතට දෙවියන්වහන්සේ දාවිත්ව ගෙන ගියක් මෙන් ඔබවටත් උන්වහන්සේ එලෙසම කරනවා ඇත.

*2 සාමුවෙල් 5:21* හි අපට සාක්ෂියක් ඇත. එනම් ***දාවිත් පිලිස්තිවරුන්ගේ සෑම දේම විනාශ කර ජයග්‍රහණය ලබාගත්තේය.***

ස්වාමින්වහන්සේ ඔබ ඉදිරියේ ගොස් ඔබ මුහුණදෙනු ලබන පීඩාව නැමැති සියලුම සටන්කාමී මිටියාවත් උන්වහන්සේ වෙනස්කර ඔබව බලවත් ආශීර්වාදයන් වෙතට ගෙනෙන්න කියා මා යාච්ඤා කරමි. සතුරා ඔබට පහරදීමට පැමිණෙන සෑම අවස්ථාවකදී එබ සිටින්නේ නිවැරදි ස්ථානයක බව සිතන්න. මන්ද දෙවියන්වහන්සේ ඔබව ජයග්‍රහණය දෙන්නාවූ ස්ථානයකට ගෙනෙයි.

පිලිස්තිවරුන්ගේ සෑම දේම විනාශ කරමින් එහි සියල්ලම අළු බවට පත් කල දාවිත් මෙන් දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි තිබෙන සියළුම අභියෝග, බාධාවන්, කරදර ආදී සියල්ලම විනාශ කරමින් ඔබව ඉදිරියට ගෙනයනසේක.

★ ★ ★

# ස්වාමින්වහන්සේ යහපතුන් සමග සිටිනසේක. (1 ලේකම් 19:11)

### පාස්ටර් සැම් සෙල්වරාජ් විසිනි

විශ්වාසවන්ත ජීවිතයක් ගත කිරීමේ ප්‍රතිඵල බොහෝ විට අපට පිටස්තරයෙන් දැකීමට නොහැකිය. බොරුවෙන් හා මායාවෙන් ජීවත්වෙන අය ඉතා ඉක්මනින්ම දියුණුවන ආකාරය අප දකින විටදී අප අසන්නාවූ ප්‍රශ්නය නම්, ***''විශ්වාසවන්ත ජීවිතයක් ගත කිරීමේ තේරුමක් තිබෙනවාද?''*** නමුත් විශ්වාසවන්තව සිටින අයට නිසි වෙලාවේදී දිව්‍යමය උපකාරයත් ආශිර්වාදයත් ලැබෙනවාමය. ***''විශ්වාස මනුෂ්‍යයෙකුට බොහෝ ආශිර්වාද ලැබේ. (හිතෝපදේශ 28:20)***

1. දෙවියන්වහන්සේ ඔවුන්ගේ යාච්ඤාවට ඇහුම්කන් දෙන සේක.
2. දෙවියන්වහන්සේ ඔවුන්ගේ ඉල්ලීම් ඉෂ්ට කරනසේක.
3. ඔබ අනතුරක සිටින විටදී දෙවියන් වහන්සේගේ දේව දූතයින් ඔබට උපකාර කිරීමට සූදානම්ව සිටින සේක.

හෙසකියා රජතුමා දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ටව සිටිසේක. ***''ඔහු ඊශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාස කළේය. ඔහුට සමාන කිසිවෙක් ඔහුට පසුවවත් ප්‍රථමවත් යුදාහි සියළු රජුන් අතරේ නොසිටියේය. ඔහු ස්වාමිවහන්සේට ඇලුම් ව සිට උන්වහන්සේ අනුව යාම අත්නොහැර ස්වාමින්වහන්සේ විසින් මෝසෙස්ට අණකළ උන්වහන්සේගේ ආඥා රක්ෂා කළේය. ස්වාමින්වහන්සේ ද ඔහු හා සමග සිටිසේක. ඔහු ගිය තැන සමෘද්ධ විය..'' (2 රාජාවලිය 18:5-7)***

*2 රාජාවලිය 20* වන පරිච්ඡේදය කියවන විටදී මෙම රජතුමා බලවත් ලෙස රෝගතුර වී සිටි විටදී ඔහු බිත්තිය දෙසට ඔහුගේ මුහුණ හරවා ස්වාමින්වහන්සේට මෙසේ පැවසීය. ***''අහෝ ස්වාමින්වහන්ස මා සැබෑකමිනුත් සම්පූර්ණ සිතකිනුත් ඔබ ඉදිරියෙහි හැසිර, ඔබගේ ඇස් හමුයෙහි හරිව තිබුණ දේ කළ බව සිහිකල මැනවයි කියා අතිශයින් ඇඬුවේය.''*** *(2 රාජාවලිය 20:3)*

මුලදී අප මෙම සඟරාව මුද්‍රණය කරනු ලැබුයේ කිතුණු මුද්‍රණාලයකි. දිනක් මෙම මුද්‍රණාලයේ සුපරීක්ෂකවරයා 'පාස්ටර් අපි ලෝකයේ මනුෂ්‍යයන්ගෙන් වැඩ භාරගන්න විට ඔවුන්ගේ අපට මුදල් ලැබෙන එක ස්ථිරයි. ඒත් දෙවියන්වහන්සේගේ මිනිස්සු කියන අයගේ වැඩ කරන විට මුදල් ලබා ගැනීම ඉතාම අමාරුයි. ඒ අය ළඟ මුදල් තිබුණත් ඒවා ගෙවන්නේ නැහැ. මට පුදුමයි මේ අය දෙවියන්වහන්සේට සේවය කරන්නේ කොහොමද කියලා'' මගෙන් ඇසුවේය.

දේව වචනය දෙස බලන විටදී විශ්වාසවන්ත හා අවංක පුද්ගලයන් සිටින බව අප දකිමු. එසේම විශ්වාසවන්ත සහ යහපත් දේ කරන අය අතර හොඳ සම්බන්ධතාවයක් තිබෙන බවද දකිමු. *2* ***ලේකම් 9:11 හි ''...ස්වාමින්වහන්සේ යහපතුන් සමග වනසේක''*** කියා අප කියමු.

***ගීතාවලිය 15: 1-2*** දක්වා ***''ස්වාමිනි, ඔබගේ මණ්ඩපයෙහි සිටින්නේ කවුද? ඔබගේ පිරිසිදු කන්දේ වසන්නේ කවුද ? අවංක ලෙස හැසිරෙන්නාවූ, ධර්මිෂ්ඨකම් කරන්නාවූ සිතින් සැබෑව කියවන්නාවූ තැනැත්තේය.''*** කියා පවසා ඇත. ***2 ලේකම් 16:9, ''මක්නිසාද ස්වාමින්වහන්සේ කෙරෙහි සම්පූර්ණ සිත් ඇත්තන්ට පිහිට වන පිණිස උන්වහන්සේ බලය පාමින්, උන්වහන්සේගේ ඇස් පොළොව මුළුල්ලෙහි ඔබමොබ දුවන්නේය....''*** ***අද දෙවියන්වහන්සේට අවශ්‍යය වන්නේ සෘජුලෙස ගමන්කරන්නා වූ පරම්පරාවකි. ලූක් 1:17 ''.....සෘජු ලෙස***

***හැසිරෙන්නන්ට උන්වහන්සේ පලිහක් වනසේක....." (හිතෝපදේශ 2:7) "නෝවා ධර්මිෂ්ට මනුෂ්‍යයෙක්ව තමාගේ පරම්පරාවන්හි සම්පූර්නව සිටියේය...." (උත්පත්ති 6:9) "....මම සර්වපරාක්‍රම වූ දෙවියන්වහන්සේය. මා ඉදිරියෙහි හැසිරෙමින් සම්පූර්ණ වෙයන්න..." (උත්පත්ති 17:1) "එවිට ස්වාමින්වහන්සේ, නුඹ මගේ මෙහෙකරු වූ යෝබ් ගැන කල්පනා කෙළෙහිද? ඔහු මෙන් නිර්දෝෂ වූ, අවංක වූ, දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇත්තා වූ, නපුරෙන් වැලකී සිටින්නා වූ මනුෂ්‍යයෙක් පොළොවේ නැත." (යෝබ් 1:8) "එවිට ඔහුගේ භාර්යාව, නුඹේ අවංකකම තවම පවත්වාගෙන යනවද? දෙවියන්වහන්සේ අතැර දමා මැරෙව" ( යෝබ් 2:9) " මා වනාහි ඔබ මාගේ අවංකකමෙහි දරාසිටින සේක. සදාකල්ම ඔබ ඉදිරියෙහි මා තබාගන්නා සේක." (ගීතාවලිය 41:12) "...ඇදහිල්ලෙහි මාගේ සැබෑ දරුවා තිමෝතියස්...."(1 තිමෝති 1:2)***

පළමුකොට, නෝවා ඔහුසිටි කාලයෙද් තනි පුද්ගලයෙක් ලෙස අවංකව සිටියේය. අපද මෙම නපුරු වු පරම්පරාවේ දෙවියන්වහන්සේ උදෙසා ඍජු ලෙස ගමන් කරන්නාවූ අය විය යුතුයි. දෙවියන්වහන්සේ අප සෑම කෙනාටම විවිධාකාර තලෙන්ත, වෙනස් වූ කටහඬ කරුණාව හා අවස්ථාවන් දී තිබේ. මා තනියම මගේ කාමරය තුළ සිටින විට, දෙවියන්වහන්සේට යාච්ඤා කරමින්, ස්වාමිනි, ඔබ මා සමග සිටින නිසා මා ඔබට ස්තුති කරමි. ඔබ මා සමග නොසිටියා නම්, මේ සියල්ල කිරීමේදී මා අසමත්ය," කියා පැවසුවෙමි. මන්ද දෙවියන්වහන්සේගේ දිව්‍යමය බලය සහ ආලේපය නිසා මෙවැනි මහත් වූ දේ කිරීමට අපට හැකි වී තිබේ. එම නපුරු පරම්පරාව තුල නෝවා අවංක පුද්ගලයෙක් බව දැක දෙවියන්වහන්සේ එහුට උපකාර කලාක් මෙන් අපත් දෙවියන්වහන්සේට අවංක වන විටදී උන්වහන්සේගේ ඇස් ඉදිරිපිට අපටද දයාව හා කරුණාව ලැබෙනු ඇත.

අප වංක නොවී සෑම දේ තුලදීම අවංකව හා විශ්වාසවන්තව සිටින්නේ නම්, ස්වාමින්වහන්සේ අප හා සමග සිටී. අපට ස්වාමින්වහන්සේගේ අභිමුඛත්වය භුක්ති විඳීමට හැකිය.

දෙවනුව දෙවියන්වහන්සේ නෝවාට කථා කරමින් නැවක් සාදනනය කියා පවසනු ලැබීය. අද බොහෝ දෙනෙක්, දෙවියන්වහන්සේ මටත් පුද්ගලිකව කථා කරමින් ඉතා පැහැදිලි ලෙස පැවැසුවා නම්, මමත් උන්වහන්සේට කීකරු වෙනවාය" කියා පවසයි. දෙවියන්වහන්සේ අපටත් කථා කිරීමට ඕනි නම්, අපගේ හදවත, අපගේ කන් පවිත්‍රව හා දෙවියන්වහන්සේට විවෘතව තබන්නට අවශ්‍යය. අප ලෝකය සමග වංක කමින් හැසිරෙනවා නම්, දෙවියන්වහන්සේගේ ආලේපයත් උන්වහන්සේගේ හඬත් අපිට අහිමි වෙයි. අප දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස ජීවත් වෙනවානම්, උන්වහන්සේගේ හඬට ඇහුම්කන් දෙනවානම්, උන්වහන්සේට භය වෙමින් ධර්මිශ්ඨ වූ ජීවිතයක් ගත කරනවානම්, උන්වහන්සේ අපගේ සියලු රෝග සුවකරයි. ප්‍රශ්ණ හා කරදර දුරු කරයි. එසේම උන්වහන්සේ නිතරම අපට කථා කරයි.

මගේ ජීවිතයේදී උන්වහන්සේගේ හඬ මා හට තුන්වතාවක් ඉතා පැහැදිලි ලෙසම ඇසුනි. එය ඉතා මිහිරි වූ හඬකි. වරක් උන්වහන්සේ මාගේ නම කියාත් ඊළඟ වතාවේදී උන්වහන්සේගේ සේවයට කැඳවන පිනිස කථාකල අතර තුන්වන වතාවේදී උන්වහන්සේ මාහට පොරොන්දුවක් දුන්නේය.

ප්‍රිය දේව දරුවෙනි, උන්වහන්සේ අපව අමතක කිරීමට උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත. ඔබ කලාවූ සෑම යහපත් ක්‍රියාවක්ම උන්වහන්සේ අමතක කරන්නේ නැත.

....Contd. to page 9


# RESIDENTIAL BIBLE COURSE

**NEHEMIAH BIBLE COLLEGE, Chennai.**

Pray for

Rush for Admission!

Medium : Hindi/Tamil

Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years

*Certificate in Ministry*
*Diploma in Theology*

Qualification : 10th Standard & above

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org

✶ ONLINE CLASSES ARE AVAILABLE ✶



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*

**"නුමුත් ස්වාමින්වහන්සේ ගැන බලා සිටින්නෝ තමුන්ගේ සවිය අලුත්කරගන්නෝය" (යෙසායා 40:31)**

මගේ සේවයේ මුල් කාලයේදී එනම්, 1972 වන වර්සයේදී දෙවියන්වහන්සේ මට කථා කරමින් චෙන්නෙහි වල පිහිටි සයිදපෙට් නැමැති ස්ථානයට ගොස් ශුභාරංචි රැස්වීම් මාලාවට මිනිසුන්ට ආරාධනා කරන පිනිස දැන්වීම් පුවරු, පත්‍රිකා ආදී දේ සූදානම් කළෙමු. මනුෂ්‍යයන් මෙම රැස්වීම් මාලාවට ගෙනෙන පිණිස මා සමඟ සිටි අය පූර්ණ සහයෝගය ලබා දුන්නේය.

මෙම රැස්වීම් මාලාව වෙනුවෙන් අප බොහෝ යාච්ඤාවන් කළෙමු. මාගේ මිත්‍රයෙක් ඔහුගේ වාදන කණ්ඩායමද විශේෂ ගීතිකා කොලද මෙම රැස්වීම මාලාවට ගෙනාවේය. නමුත් එම නියමිත දිනදී කිසිම සෙනඟක් එහි පැමිණියේ නැත. අපි දිගු වේලාවක් බලා සිටියේය. අවසානයේදී සහෝදරයන් දෙදෙනෙක් පැමිණියේය. ඒ දෙදෙනා දුටු විට අපගේ හදවත් ක්ලාන්තයට පත් විය. මන්ද අප මෙතරම් වැඩකර බොහෝ දැන්වීම් ලබා දුන්නත් මෙහි පැමිණියේ දෙදෙනෙක් පමණි. මා සමඟ සිටි සෑම කෙනෙක්ම මගෙන් ඇසූ ප්‍රශ්නය නම්, දෙවියන්වහන්සේ අපට පිලිතුරු දුන්නේ නැත්තේ ඇයි සහ අපගේ අමාරු වැඩ වලට ප්‍රතිඵලයක් ලබා දුන්නේ නැත්තේ ඇයි කියා එයට මා පිළිතුරු දෙමින් පවසනු ලැබුයේ, දෙවියන්වහන්සේ උන්වහන්සේගේම මාර්ගය තුළ ක්‍රියා කරයි. මා මාගේ බලාපොරොත්තුව අත් හරින්නේ නැත. ***"මා මගේ ස්වාමීන්වහන්සේ තුළ මාව ශක්තිමත් කරගත්තේය"*** *(1 සාමුවෙල් 30:6)*

කෙසේ හෝ අප නමස්කාර මෙහෙයක්ද මා බලවත් දේශනාවක් කළෙමි. එහි පැමිණි දෙදෙනාගෙන් එක් අයෙක් ඔහුගේ ජීවිතය දෙවියන්වහන්සේට කැප කළේය. පසුව ඔහු මා හා සමඟ සේවය කරන පිණිස කැපවූවේය.

අද දෙවියන්වහන්සේ මාව ඉන්දියාව තුළත් තවත් බොහෝ රටවල් වලත් දහස් ගණන් සෙනඟට දේශනා කරන පිණිස පාවිච්චි කරයි. ස්වාමීන්වහන්සේගේ නාමයට මහිමය වේවා. මෙවැනි තත්ත්වයකට පැමිණෙන පිණිස ඇදහිල්ලෙන් හා ඉවසීමෙන් යුතුව බලා සිටීමට මට සිදු විය.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, අද ඔබ අධෛර්යය වී කළ කිරීමට පත් වී සිටිනවාද? අද පිළිතුරු නැහැ කියා සිතනවාද? සමහර විට දෙවියන්වහන්සේ නිහඬයි. අප ඉතා ක්ෂණිකව පිලිතුරු බලාපොරොත්තු වන නමුත් දෙවියන්වහන්සේ අපව සෝදිසි කර බලයි.

*"....  එසේද වුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂාකිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීමේදී ප්‍රශංසාවත්, මහිමයත්, ගෞරවයත් පැමිණෙන පිණිසය" (1 පේත්‍රුස් 1:7)*

ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

★ ★ ★

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for BIBLECOR**

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.
Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** – Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** – Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press – Publications
11. St. Paul's Matriculation School – Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

*7 පිටුවෙන්....*

(හෙබ්‍රෙව් 6:10) උන්වහන්සේ ධර්මිෂ්ඨ වූ දෙවියන්වහන්සේයි. ඔබ උන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨව හැසිරෙනවානම්, උන්වහන්සේ දෙසට හැරෙනවානම්, උන්වහන්සේ දෙසට හැරෙනවානම්, උන්වහන්සේ ඔබ හා සමග ඇවිදියි. උන්වහන්සේගේ හඬ ඔබට ඇසෙයි. මේ සැමට වඩා උන්වහන්සේගේ කැමැත්ත ඉෂ්ඨ කිරීමට උන්වහන්සේගෙ කරුණාව අපට දෙයි.

උන්වහන්සේගේ ආශිර්වාදය අපට අත්පත් කර ගැනීමට හැකි වන්නේ උන්වහන්සේගේ සේවයට අප කොතරම් කැපවීමක් කරනවාද යන්න මතයි.

තුන්වෙනුව, දෙවියන්වහන්සේ තෝරාට කරණ පිණිස වැඩක් පවරන ලදී. අප දෙවියන්වහන්සේ දාසයින් ලෙස උන්වහන්සේගෙන් අණ ලබාගෙන උන්වහන්සේ පවසන්නාවූ වැඩය කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ඔබ උන්වහන්සේට මුළුමනින්ම කැප වෙනවානම්, දෙවියන්වහන්සේගේ හස්තය ඔබ සමග ක්‍රියා කරන බව ඔබ දකී. උන්වහන්සේෙ වැඩය අපට නිවැරදි ලෙස කරගැනීමට නොහැකි වී තිබෙන්නේ, උන්වහන්සේගේ ප්‍රේමය හා කරුණාව අප තුල නොමැති නිසාය. අපගේ බලයෙන් අප ක්‍රියා කිරීමට උත්සාහ කරන විටදී අප පරාජයට පත්වෙනු ඇත. නමුත් අප දේව කැමැත්ත තුල අපගේ වැඩ කටයුතු කරන විටදී ඒ දෙයට උන්වහන්සේගේ බලය ලැබෙනු අත.

ස්වාමින්වහන්සේ අපගේ සියලු හැකියාවන් දියුණු වීමට උපකාර කරමින් අපව සුදුස්සෙක් ලෙස පත් කරයි. අපගේ සියලු වැඩ වලට ස්වාමින්වහන්සේගේ ආශිර්වාදය ලැබෙයි. දෙවියන්වහන්සේ සේවය කිරීමට මේ ලෝකයේ ඇති මහත් ආශිර්වාද ලත් දෙයකි. සමහර දේව දාසයින් මෙසේ පවසයි. ''මගේ පුතා දෙවියන්වහන්සේට සේවය කිරීමට තෝරාගෙන තියනවා, එහෙත් එයා ජීවත් වීමට

RNI NO. TN/SIH/2006/17846

**Echo of His Call**

**YouTube**
**Please subscribe**

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks. **- Editor**

යන්නේ කොහොමද කියා මා දන්නේ නැහැ'' නමුත් මා පවසන්නේ ස්වාමින්වහන්සේගේ රාජ්‍ය උදෙසා වැඩ කරන පුද්ගලයාට දෙවියන්වහන්සේ නොවරදවාම ආශිර්වාද කරන බවයි. නෝවා දෙවියන්වහන්සේ විසින් අණ කළාවූ සියලුම වැඩ සම්පූර්ණ කලේය.

බොහෝ අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේ අපට දෙන්නාවූ සැලැස්ම පිළිගැනීමට අපට අසීරුය. එය අපගේ හැකියාවට වඩා විශාලයි. කියා අපි සිතමු. නමුත් අප සියල්ලෝම දෙවියන්වහන්සේ පැවසූවාවූ අණ ඉටුකරයි කියා උන්වහන්සේ බලාපොරොත්තු වෙයි. උන්වහන්සේ පවසන්නාවූ කුමන දෙයක් වුවත් එය ඉෂ්ඨ කිරීමට අපට හැකිවිය යුතුය.

අවසාන ලෙස, අප කියවන්නේ, ''*නෝවා එසේ කෙළේය, දෙවියන්වහන්සේ ඔහුට අණකල සියල්ල ලෙස ඔහු කෙළේය.'' (උත්පත්ති 6:22)* උන්වහන්සේ විසින් ආරම්භ කළාවූ සියලුදේම උන්වහන්සේ සම්පූර්ණ කරනසේක. ඔබගේ ජීවිතය තුල ආරම්භ කලාවූ දේ කුමක් ද? ඒ දෙය උන්වහන්සේ සම්පූර්ණ කරනසේක. ඔබ කල යුත්තේ දෙවියන්වහන්සේට භයවීම පමණි. දෙවියන්වහන්සේ ඉදිරියෙහි විශ්වාසවන්තව සිටින්න.

බොරු නොකියන්න. බොහෝ දෙනා ඇත්ත පැවසීමට කැමැති නමුත් එයට පෙර බොරුවක් පවසයි. දෙවියන්වහන්සේට බොරුකාරයින්ව පාවිච්චි කිරීමට බැරිය. වංක කෙනෙක් නොවී අවංක කෙනෙක් වෙන්න. ''... ස්වාමින්වහන්සේ යහපතුන් සමග වනසේක.'' (2 ලේකම් 19:11)

* * *

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

**on 2nd AUGUST 2024.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

P.O. Box No. 2957,

Chepauk, Chennai - 600 005, INDIA.

Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**